(2)

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් බඳවා ගැනීම හා උසස් කිරීම සඳහා</u>

<u>ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය - අංක 02</u>

| ඡේද අංකය | දැනට තිබෙන පෙළ | ඡේද අංකය | ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සංශෝධනය |
|---|---|---|---|
| 9.1.1 (ආ) | <u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u> මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ.(සේවයේ යෙදී සිටින අය සඳහා අවශ්‍ය සුදුසුකම අටවන (08) ශ්‍රේණිය / 09 වසර සමත් බවට ලිහිල් කෙරේ. | 9.1.1 (ආ) | රා.ප.ච. අංක 03/2016 අනුව PL-1,PL-2 හා PL-3 කාණ්ඩයේ වැටුප් කේත යටතේ මධ්‍යම පළාත් සභාවේ සේවයේ නිරත ස්ථිර/අනියම්/ආදේශක පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට අයදුම් කල හැකිය. |
| 9.1.4 (ඌ) | වයස අවුරුදු 18ට නොඅඩු හා 45 නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවෙකුට එනම් ඒ වන විටත් <u>රාජ්‍ය සේවයේ</u> හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයෙක් නම් උපරිම වයස් සීමාව අදාල නොවේ. | 9.1.4 (ඌ) | වයස අවුරුදු 18ට නොඅඩු හා 45 නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවෙකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයෙක් නම් උපරිම වයස් සීමාව අදාල නොවේ. |
| 9.5 | බඳවා ගනු ලබන්නේ ඉහත කී සේවා ගණයේ 111 ශ්‍රේණියට පමණි.111 ශ්‍රේණියට බඳවා ගැනීමේ දී යම් වර්ෂයකදී පත් කළ යුතු සංඛ්‍යාව වනුයේ එම වර්ෂයේ ජූනි 30 දිනට හා දෙසැම්බර් 31 දිනට සේවක ගණයේ ඒකාබද්ධ සේවක සංඛ්‍යාව තුල පැවති පුරප්පාඩු සංඛ්‍යාවයි | 9.5 | බඳවා ගනු ලබන්නේ ඉහත කී සේවා ගණයේ 111 ශ්‍රේණියට පමණි.111 ශ්‍රේණියට බඳවා ගැනීමේ දී අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පවතින අනුමත සේවක සංඛ්‍යාවට අදාළ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

අනුමත කරමි / නොකරමි

.............................

පී. බී. දිසානායක

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරු

20 18.08.15